# KOHA

# ඩිජිටල් යුගයේ පුස්තකාල කළමනාකරණය

## දෙවන කොටස

# KOHA

# ඩිජිටල් යුගයේ පුස්තකාල කළමනාකරණය

## දෙවන කොටස


**නිශාන් පුංචිහේවා**

MLS (Colombo), BSc (Colombo)

**බුද්ධින් කුමාර**

MISM (Colombo), BSc (Sri Jayewardenepura)



NINE Publishing

නයින් ප්‍රකාශකයෝ

2024

**KOHA: ඩිජිටල් යුගයේ පුස්තකාල කළමනාකරණය (දෙවන කොටස)**

**© 2024**

සියලු හිමිකම් ඇවිරිණි. මෙම පොත හෝ එහි කොටස් කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය කිරීම, කිසියම් ප්‍රතිසාධන පද්ධතියක ගබඩා කිරීම හෝ ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත්, පටිගත කිරීම හෝ වෙනත් ඕනෑම ආකාරයකින් සම්ප්‍රේෂණය කිරීම කතුවරුන්ගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු කළ නොහැකි ය.

**ISBN:** 978 624 5717 47 7

**කවර නිර්මාණය**

කිත්සිරි සිරිවර්ධන

ස්ට්‍රැටජික් සොලුයුෂන්ස්
kithsiri@strategic.lk

**මුද්‍රණය**

රන්ධි ප්‍රින්ටර්ස්

22, සේසත වත්ත, වදුරමුල්ල
පානදුර

**ප්‍රකාශනය**

NINE Publishing

නයින් ප්‍රකාශකයෝ

21, මුරුගන් පෙදෙස
කොළඹ - 06
www.ninepublishing.com

## පිළිගැන්වීම

අපගේ දෙමව්පියන්ට

පවුලේ සාමාජිකයන්ට

ගුරුවරුන්, උපදේශකයින් සහ මිතුරන් වෙතට

# පටුන


| | | |
|---|---|---|
| | පෙරවදන | ix |
| | කතුවරුන්ගේ සටහන | xi |
| | කතුවරුන් පිළිබඳව | xii |
| පරිච්ඡේදය - 01 | ප්‍රතිග්‍රහණ මොඩියුලය | 1 |
| පරිච්ඡේදය - 02 | වාර ප්‍රකාශන මොඩියුලය | 27 |
| පරිච්ඡේදය - 03 | මාර්ගගත සූචිය වින්‍යාසය | 42 |
| පරිච්ඡේදය - 04 | වාර්තා මොඩියුලය | 53 |

# පෙරවදන

නිශාන් පුංචිහේවා සහ බුද්ධින් කුමාර මහත්වරුන් විසින් 'කොහා' සමෝධානිත පුස්තකාල කළමනාකරණ පද්ධතිය පිළිබඳ පළ කරනු ලබන පොත් මාලාවේ දෙවන වෙළුම සඳහා මා පෙරවදනක් සපයන්නේ ඉමහත් සතුටකිනි. මොරටුව විශ්ව විද්‍යාලයීය පුස්තකාලය තුළ වසර ගණනාවක් පුරා එක්ව කටයුතු කර ඇති සමීප සගයකු වශයෙන්, පුස්තකාල ස්වයංක්‍රීයකරණ ක්ෂේත්‍රය පිළිබඳ ඔවුන්ගේ ගැඹුරු ප්‍රවීණත්වය සහ ඒ සඳහා දැක්වූ නො සැලෙන කැපවීම සියැසින් දැකීමේ වරප්‍රසාදය මට ලැබී ඇත.

නිශාන් පුංචිහේවා සහ බුද්ධින් කුමාර මහත්වරුන් පුස්තකාල මෘදුකාංග, පුස්තකාල ස්වයංක්‍රීයකරණය ඇතුළු තොරතුරු සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ මාතෘකා පිළිබඳ පළපුරුදු ගුරුවරුන් පමණක් නොව, ප්‍රායෝගිකව ඒවා ක්‍රියාත්මක කිරීමේ ද සුවිශේෂී ප්‍රවීණතාවයක් පෙන්නුම් කර ඇත. විවිධ පුස්තකාල තුළ කොහා පද්ධති සාර්ථකව ස්ථාපනය කර තිබීම, ඔවුන්ගේ හැකියාව සහ කැපවීම පිළිබඳ සාක්ෂියකි. මෙම පුස්තකාල පද්ධතිය පිහිටුවීම, නඩත්තු කිරීම සහ දෝශ නිරාකරණය කිරීම සම්බන්ධව ශ්‍රී ලංකාවේ සිටින අතළොස්සක් වන විද්වතුන් අතර ඔවුහු ඉදිරියෙන් ම සිටිති.

ඔවුන්ගේ 'කොහා' මාර්ගෝපදේශ පොත් මාලාවේ මෙම දෙවන වෙළුම මගින්, පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීම, වාර සඟරා පාලනය, OPAC සහ වාර්තා මොඩියුල වින්‍යාස කිරීමේ සහ සැකසීමේ අවශ්‍යතා පිළිබඳ සොයා බලයි. පුස්තකාල ස්වයංක්‍රීයකරණ පද්ධතියක් තුළ පවත්නා මෙම තීරණාත්මක සංරචක ඵලදායි ලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය දැනුම මෙම පොත මගින් පාඨකයන්ට මැනවින් ලබා දී ඇත. විස්තර කිරීම් ක්‍රමානුකූල වන අතර, තිර පිටපත් සමග පැහැදිලි කිරීම් සිදු කර ඇත. එහෙයින් මෙම පොත හුදු මාර්ගෝපදේශයක් පමණක් නොව නවීන පුස්තකාලවල වැඩෙන, විකසනය වන අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කරන ලද කොහා මාර්ගගත පුස්තකාල ස්වයංක්‍රියකරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය ප්‍රගුණ කිරීමට මාර්ග සිතියමකි.

ඒ අනුව, මම සියලු ම පුස්තකාල වෘත්තිකයන්ට සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණවේදීන්ට මෙම පොත හදවතින් ම නිර්දේශ කරමි. පුස්තකාල සේවාවන්හි ප්‍රවේශ්‍යතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සිය වෘත්තීය ජීවිතය කැප කළ විශේෂඥයින් දෙදෙනෙකු විසින් නිර්මාණය කරන ලද එය, පුස්තකාල ක්ෂේත්‍රයට විශිෂ්ට දායකත්වයක් සපයයි.

**ආචාර්ය රුවන් ගමගේ**

ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

# කතුවරුන්ගේ සටහන...

KOHA යනු මහජන, ශාස්ත්‍රීය, විශ්වවිද්‍යාල සහ විශේෂ පුස්තකාල ඇතුළු විවිධ පුස්තකාල විසින් ඉතා ඉහළින් භාවිත කරන වර්තමාන ශ්‍රී ලංකාවේ වඩාත්ම ප්‍රචලිත පුස්තකාල කළමනාකරණ පද්ධතිය වේ. ශ්‍රී ලංකාවේ බොහෝ පුස්තකාල සඳහා සීමා සහිත වූ අයවැයක් ඇති අතර, මිල අධික වාණිජ පුස්තකාල කළමනාකරණ පද්ධති වෙනුවට KOHA ලාභදායී විකල්පයක් ඉදිරිපත් කරයි. KOHA හි විවෘත මූලාශ්‍ර ස්වභාවය බලපත්‍ර ගාස්තු ඉවත් කරන අතර මූල්‍යමය සීමාවන් සහිත ආයතන සඳහා ආකර්ශණීය තේරීමක් බවට පත්ව ඇත. KOHA හි පිරිවැය-ඵලදායීතාවය, අනුවර්තනය වීමේ හැකියාව සහ විවිධ පුස්තකාල සැකසුම්වල විශේෂිත අවශ්‍යතා සපුරාලීමේ හැකියාව හේතුවෙන් එහි භාවිතය වඩාත් වර්ධනය වී ඇත.

පුස්තකාල හා තොරතුරු විද්‍යාව ඉගැන්වීමේ නියැළී සිටින කථිකාචාර්යවරුන් වශයෙන්, KOHA පුස්තකාල කළමනාකරණ පද්ධතිය පිළිබඳව සිංහල භාෂාවෙන් පොතක් ලිවීමට අප හට නිශ්චිත හේතු කිහිපයක් තිබුණි. එක් හේතුවක් නම්, සිසුන් සඳහා උසස් තත්ත්වයේ අධ්‍යාපන සම්පත්වල අවශ්‍යතාව අප අවබෝධ කර ගෙන තිබීමයි. KOHA පුස්තකාල කළමනාකරණ පද්ධතිය පිළිබඳ බොහෝ පොත් ඇතත්, ඒවා බොහොමයක් ඉංග්‍රීසි භාෂාවෙන් ලියා ඇත. KOHA පුස්තකාල කළමනාකරණ පද්ධතියට අදාළව සිංහලෙන් ලියා ඇති සම්පත් සොයා ගැනීම ඉතා අපහසුය. එම නිසා, KOHA පුස්තකාල පද්ධතිය පිළිබඳව සිංහල භාෂාවෙන් පොතක් ප්‍රකාශයට පත් කරන මෙන් සිසුන් බොහෝ දෙනෙකුගෙන් ඉල්ලීම් රැසක් අපවෙත ලැබී තිබුණි.

එසේම, අපගේ දැනුම සහ අත්දැකීම් උපයෝගී කරගෙන විවිධ පුස්තකාල සඳහා KOHA පද්ධතිය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘති රැසක් සාර්ථකව සම්පූර්ණ කර ඇත. මෙහිදී අප ලද අත්දැකීම් අන් අය සමග බෙදා ගැනීමට ඉමහත් කැමැත්තකින් පසුවන්නෙමු. පොතක් ප්‍රකාශයට පත් කිරීම මගින් අපගේ අත්දැකීම් අන් අය වෙතට ලබා දීමට අවස්ථාව ලැබෙන අතරම KOHA භාවිත කරනු ලබන ප්‍රජාවගේ අවශ්‍යතා වලට යම් පමණකට හෝ දායක වීමට ඉඩ සලසයි.

මෙම පොත ප්‍රකාශයට පත් කිරීම සඳහා අප දිරි ගැන්වූ සැම දෙනාම ඉතාම ගෞරවයෙන් සිහිපත් කරන අතර සෝදුපත් බැලීමෙන් අනගි මෙහෙවරක් සිදු කළ කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනි සමන්ලතා මැණිකේ සොයුරියට අපගේ හදපිරි ප්‍රණාමය මෙයින් පුද කරමු.

# කතුවරුන් පිළිබඳව

## නිශාන් පුංචිහේවා



නිශාන් පුංචිහේවා කොළඹ විශ්වවිද්‍යාලයට ඇතුළත්ව 1998 වසරේදි විද්‍යාවේදී උපාධිය ලබා ගත්තේය. කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක තාක්ෂණ ආයතනයේ තාවකාලික උපදේශකවරයකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර 2003 වසරේදී මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස සේවයට එක් විය. ඔහු මේ වනවිට පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ වසර 21ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. මෙම කාලය තුළ ඔහු පුස්තකාලයේ විවිධ අංශවල සේවය කර ඇති අතර දැනට මොරටුව විශ්ව විද්‍යාල පුස්තකාලයේ වාර සඟරා සහ සහ විමර්ශන අංශයේ ජ්‍යෝෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයා ලෙස සේවය කරයි.

නිශාන්, 2008 දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ගත්තේය. එසේම ඔහු ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ (SLLA) වරලත් පුස්තකාලාධිපතිවරයෙකි. ඔහු, වෙබ් සම්බන්ධීකාරක (2022/2023 සහ 2023/2024), තොරතුරු තාක්ෂණ කමිටුවේ සාමාජික (2022/2023 සහ 2023/2024) සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන කමිටුවේ සාමාජික (2015/2016) ලෙස SLLA හි විවිධ තනතුරුවල ක්‍රියාකාරී භූමිකාවන් ඉටු කර ඇත.

ඉලෙක්ට්‍රොනික තොරතුරු සම්පත් භාවිතය, පුස්තකාල ස්වයංක්‍රීයකරණය, පුස්තකාල පද්ධති, ඩිජිටල් පුස්තකාල සහ පුස්තකාලවල විවෘත මූලාශ්‍ර සම්පත් භාවිතය ආදී විෂයයන් පිළිබඳ බොහෝ පර්යේෂණ ප්‍රකාශන සඳහා ඔහු දායක වී ඇත. එසේම, මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා පුස්තකාල සම්පත් දායකයකු ලෙස ක්‍රියා කරන අතරම කොළඹ විශ්ව විද්‍යාලයේ ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනයෙහි (NILIS) බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද 2008 වර්ෂයේ සිට මේ දක්වා සේවය කරයි.

## බුද්ධින් කුමාර



බුද්ධින් කුමාර මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෝෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස සේවයේ නියුතු වන අතර කොළඹ විශ්ව විද්‍යාලයෙන් තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. එසේම, දෙවන පන්තියේ (ඉහළ පෙළ) සාමාර්ථ්‍යයක් සහිතව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධි ලාභියෙකි. එමෙන්ම 2005 දී Sun Microsystems වෙතින් Sun Certified Programmer තනතුර ද ලබා ඇත.

ආයතනික ඩිජිටල් ගබඩා (Institutional Digital Repositories) සහ ඒකාබද්ධ පුස්තකාල කළමනාකරණ පද්ධති (Integrated Library Management System) ස්ථාපනය කිරීමේ ව්‍යාපෘති රැසක් සාර්ථකව ඔහු විසින් ක්‍රියාත්මක කර ඇති අතර එම ක්ෂේත්‍ර සම්බන්ධව අත්දැකීම් සම්භාරයකින් යුක්තය.

කුමාර විසින් ප්‍රකාශිත පර්යේෂණ පත්‍රිකා සහ සම්මන්ත්‍රණ ඉදිරිපත් කිරීම් හරහා පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයට විශාල දායකත්වයක් ලබා දී ඇත. ඒ ප්‍රකාශන අතර පුස්තකාල පරිශීලක අධ්‍යාපන වැඩසටහන් පිළිබඳ සිසුන්ගේ සංජානනය සහ මොරටුව විශ්ව විද්‍යාලයේ පර්යේෂණ සිසුන් අතර සිදුවන නිසියාකාර නොවන තොරතුරු භාවිතයන් පිළිබඳ අධ්‍යයනයන් ද ඇතුළත් වේ.

2011 වසරේ සිට කුමාර, කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනයේ (NILIS) තොරතුරු විද්‍යාව පිළිබඳ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කරන අතර එහිදී ඔහු තම ප්‍රවීණත්වය සහ දැනුම ඊළඟ පරම්පරාවේ තොරතුරු වෘත්තිකයන් සමඟ බෙදා ගන්මින් සිටියි.

ඔහු, KOHA විවෘත මූලාශ්‍ර පුස්තකාල කළමනාකරණ පද්ධතිය සහ DSpace ඩිජිටල් ලේඛන කළමනාකරණ පද්ධතිය සඳහා සම්පත් දායකයෙකු සහ උපදේශකයෙකු ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ අධ්‍යාපනික සහ පර්යේෂණ ආයතන රැසකට දායකත්වය ලබාදී ඇත.